මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.:
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.07.11

## මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකාව 2025 ආයෝජක සබඳතා පරිචයන්හි ඉහළම ලකුණු වර්ධනය කරගැනීමක් වාර්තා කිරීම

විවිධ භූගෝලීය කලාපවල නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික 54ක් ආවරණය කරමින් ජාත්‍යන්තර මූල්‍ය පිළිබඳ ආයතනය (Institute of International Finance) විසින් ආයෝජක සබඳතා සහ ණය විනිවිදභාවය පිළිබඳ 2025 ජූලි 09 වන දින ප්‍රකාශයට පත් කරන ලද නවතම වාර්තාවේ (Investor Relation and Debt Transparency Report) දක්වා ඇති පරිදි, 2025 දී ශ්‍රී ලංකාව සිය ආයෝජක සබඳතා පරිචයන්හි ඉතා ඉහළ වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2023 දී ලකුණු 25.2 සහ 2024 දී 28.21 සිට 2025 දී සමස්ත ලකුණු 50 න් 37.33 දක්වා ඉහළ වර්ධනයක් සහිතව, ශ්‍රී ලංකාව ඉහළම ලකුණු වර්ධනය කරගැනීම් අතරින් 5 වන ස්ථානය (+9.1) වාර්තා කර ඇත.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය තුළ අලුතින් පිහිටුවන ලද රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ (Public Debt Management Office) ආයෝජක සබඳතා සඳහා ඒකකයක් (Investor Relations Unit) ආරම්භ කිරීමත් සමඟම, ශ්‍රී ලංකා රජය හා ජාත්‍යන්තර මූල්‍ය පිළිබඳ ආයතනය සමඟ පළමු නිල සම්බන්ධතාවය 2025 දී සිදු විය. ජාත්‍යන්තර මූල්‍ය පිළිබඳ ආයතනයට අනුව, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයෙහි විධිමත් ආයෝජක සබඳතා වැඩසටහනක් පැවතීම 2025 දී ලකුණු වර්ධනය සඳහා ප්‍රධාන සාධකයක් වී ඇත. අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහාය ඇතිව රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයෙහි නිල මැදිහත්වීම් ආයෝජක සබඳතා සමීක්ෂණය සඳහා නිශ්චිත කාලය තුළදී ප්‍රතිචාර දැක්වීමට සහ ආයෝජකයින්ට ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත ප්‍රවේශ වීම වැනි ශ්‍රී ලංකාවේ ලකුණු වර්ධනය කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය ක්‍රියාකාරකම් කිහිපයක් ආරම්භ කිරීමට පහසුකම් සපයන ලදී.

ශ්‍රී ලංකාවේ ආයෝජක සබඳතා ලකුණු මට්ටම වර්ධනය වීම, රටේ ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ ආයෝජක සංජානනය වැඩිදියුණු කිරීමට, ආයෝජක පැහැදීම හා විශ්වාසය ගොඩනැගීමට, මූල්‍යකරණ පිරිවැය අඩු කිරීමට සහ වඩා හොඳ ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම් ලබා ගනිමින් වෙළඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කිරීමට දායක වනු ඇත. 2025 දී රටේ ආයෝජක සබඳතා ලකුණු සැලකිය යුතු ලෙස වර්ධනය වීම ශ්‍රී ලංකාව ස්ථාවරව ඉදිරියට යන බවට සාක්ෂියකි.

ජාත්‍යන්තර මූල්‍ය පිළිබඳ ආයතනයේ ආයෝජක සබඳතා සහ ණය විනිවිදභාවය පිළිබඳ වාර්තාව වෙත පහත සබැඳියෙන් ප්‍රවේශ විය හැක.

https://www.iif.com/LinkClick.aspx?fileticket=6un67bl3BWQ%3d&portalid